
## 7. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය

ඔබ සතු පෞද්ගලික ඡායාරූප, වීඩියෝ, හඬපට කිසිවක් අන්තර්ජාලයේ හෝ වෙනත් අන්සතු වියහැකි තැනක ගබඩා නොකරන්න. එවැනි දේ නවීන තාක්ෂණය යොදාගෙන සූක්ෂම ලෙස වෙනස් කර ඔබට හානිවන අයුරින් සකසා අන්තර්ජාලය වෙත මුදා හැරිය හැකිය. එලෙස වෙනස් කරන ලද දේ පෙන්වා ඔබගෙන් කප්පම් ලබාගත හැකිය. දැඩි අපහසුතාවට පත් කළ හැකිය.



## 8. අසභ්‍ය තොරතුරු

ඡායාරූප, වීඩියෝ, ලිපි, හඬපට වැනි ඕනෑම මාධ්‍යක ඇති අසභ්‍ය තොරතුරු හෝ කෙනෙකු අපහසුතාවයට පත්වන කිසිවක් අන්තර්ජාලය හෝ වෙනත් කිසිඳු මාධ්‍යකින් ප්‍රකාශයට පත්කළ නොහැකිය. එවැනි තොරතුරු තමා සන්තකයේ තබාගැනීම, විකිණීම, වෙනත් අයෙකුට පැවරීම, වෙනත් කෙනෙකුට පරිහරණය කළ හැකි අයුරින් ගබඩා කිරීම වරදකි.

## 9. මාධ්‍ය භාවිතා කිරීම

ජංගම දුරකථනය හෝ අන්තර්ජාලය භාවිතා කිරීමේදී, නාඳුනන දුරකථන ඇමතුම්, කෙටි පණිවුඩ, විද්‍යුත් තැපැල් ලිපි යොදා ගනිමින් ඔබ වෙත උදව් දීම, නොමිලේ යම් යම් දේ දීම, ඔබගේ ගිණුමට මුදල් තැන්පත් කිරීම, ඔබ ත්‍යාගහිමියකු සේ පවසා මුදල් ලබාදීම, නිවසේ ඇති පරිගණකයෙන් මුදල් ඉපයීම, වැනි දේ සඳහා ඔබ යොමුකරවාගත හැක. කිසි විටකත් කිසිඳු උවමනාවක් සඳහා ඔබගේ ගිණුම්වල මුරපද කිසිවකුට ලබා නොදෙන්න. අන්තර්ජාලය පිළිබඳ හොඳින් අවබෝධයක් ඇති කරගෙන ඔබේ අවශ්‍යතාවයට පමණක් එය යොදා ගැනීමට හැකි දක්ෂයකු වන්න.

## 10 අන්තර්ජාල භාවිතයේදී පිළිපැදිය යුතු ආචාර ධර්ම

- ව්‍යාජ ඊ-මේල් ගිණුම්, සමාජ ජාල වෙබ්අඩවි සෑදීමෙන් වලකින්න.
- අන් අයගේ අනුදැනුමෙන් තොරව ඔවුන්ගේ තොරතුරු අන්තර්ජාලයට එක් නොකරන්න.
- අන්තර්ජාලය තුළ පුද්ගලිකත්වය ආරක්ෂා නොවන තොරතුරු භාවිත නොකරන්න.
- පුද්ගලයකුට, ආයතනයකට, ආගමකට හෝ දේශපාලන පක්ෂයකට අපහාස වන අයුරින් අන්තර්ජාලය භාවිත නොකරන්න.
- පුද්ගලයකු ගේ සේයාරුව වෙනස් කිරීම. බද්ධ කිරීම, එවැනි දේ කර මුහුණු පොතට හෝ වෙනත් වෙබ් අඩවිවලට ඇතුල් නොකරන්න.

## 11. අපරාධ දැනුම් දීම

ඉහත සඳහන් කළ ඕනෑම තත්වයක් අපරාධයකි. එවැනි අපරාධ අන්තර්ජාලයෙන් හෝ ඕනෑම මාධ්‍යකින් ඉදිරිපත් කිරීම වරදකි. ඉහත අපරාධ ඔබට සිදු වුවහොත් හෝ ඔබ දන්නා හෝ නොදන්නා කෙනෙකුහට සිදු වුවහොත් එය පහත සඳහන් ආයතන වලට දැනුම් දෙන්න

1. අන්තර්ජාල අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව: 011 2691982
2. ජාතික ළමාරක්ෂක අධිකාරිය: 1929
3. සර්ට් ශ්‍රී ලංකා ආයතනය: 011 2691692
   විද්‍යුත් තැපෑල: slcert@slcert.gov.lk
4. පීස් සංවිධානය 011 2819397/0712733037
   info@ecpatsrilanka.org


**පීස් සංවිධානය (PEaCE)**


පරිසරය සහ සැමතැන වෙසෙන
ළමුන් සුරැකීමේ සංවිධානය
Protecting Environment and Children Everywhere

ලිපිනය : අංක 165/2, දුටුගැමුණු වීදිය, කොහුවල
No 165/2, Dutugenunu Street, Kohuwala

| | |
|---|---|
| දුරකථනය / Tel: | 011 2819397 |
| ජංගම / Mobile: | 071 2733037 |
| ෆැක්ස් / Fax : | 011 2768862 |
| විද්‍යුත් තැපෑල/E mail: | info@ecpatsrilanka.org |


# ජංගම දුරකථන හා අන්තර්ජාල භාවිතා කිරීමේදී දෙමාපියන් හා දරුවන් විසින් පිළිපැදිය යුතු කරුණු

කාලීන අවශ්‍යතා මත දරුවන් සහ දෙමාපියන් විසින් දැනුවත් විය යුතු කරුණු සම්පිණ්ඩනය කර "පීස්" සංවිධානය විසින් සකසන ලද ප්‍රකාශනයකි.




පරිසරය සහ සැමතැන වෙසෙන
ළමුන් සුරැකීමේ සංවිධානය
එක්පැට් ශ්‍රී ලංකා




## 1. භාවිතය

ජංගම දුරකථනය හා අන්තර්ජාලය යහපත් ලෙස භාවිත කළ හැකි ක්‍රම බොහෝ ඇත. එය විශ්ව දැනුම ඔබගේ දෙපා මුලට ගෙන එයි. දැනුම යාවත්කාලීන කරයි. ඉදිකටුවක් නිෂ්පාදනයේ සිට විශ්වයේ රහස් සොයා යන අභ්‍යාවකාශ යානය දක්වා එය විහිදී යයි. එය සැමගේ ජීවිත පහසු කරයි. එහෙත් එය ප්‍රවේශමෙන් භාවිතයට ගතහොත් පමණි



## 2. අවභාවිතය

ජංගම දුරකථනය සහ අන්තර්ජාලය අනිසි ලෙස යොදාගත හැකි ක්‍රම බොහෝ ඇත. මේ මගින් බොරු කියා රැවටීමේ සිට සියදිවි නසා ගැනීම දක්වා වූ සමාජ විරෝධී ක්‍රියාද සියළුම ගණයේ අපරාධ සැලසුම් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ද යොදාගත හැකිය. ඒ පිළිබඳ ඔබ හොඳින් දැනුවත් වන්න.



## 3. දැනුවත් වන්න

ඔබගේ විද්‍යුත් තැපෑල දුරකථනයට ලියාපදිංචිවී ඇත්නම් ඔබ නොදැනුවත්වම ඔබගේ ස්මාර්ට් දුරකථනයේ ඇති තොරතුරු අන්තර්ජාලයට මුසුවේ. එසේ වීම අවාසිදායක වන්නේ එම දුරකථනයේ ඔබගේ අතිශය පෞද්ගලික තොරතුරු සහ ඔබට අවාසි වන ඡායාරූප, වීඩියෝ, මුරපද ගබඩා කළහොත් පමණි. එවැනි දේ ජංගම දුරකථනයේ තබා නොගන්න.



## 4. රැවටීම

අන්තර්ජාලය ඔස්සේ ඕනෑම කෙනෙකු ඔබ රැවටීමට උත්සහ දැරිය හැකිය. මෙය සිදුවන්නේ ඉතා සෙමෙන් පියවරෙන් පියවරය. එසේ වීමෙන් ඔබට දැඩි අපහසුතාවයන්ට මුහුණ දීමට සිදුවේ. ඔබ සතු අතිශය පෞද්ගලික තොරතුරු, ඡායාරූප, වීඩියෝ, මුරපද මෙන්ම තමාට අවාසිවන දේ කිසිවකුට නොපවසන්න. අන්තර්ජාලයට මුදා නොහරින්න.



## 5. සමාජජාල වෙබ් අඩවි

සමාජ ජාල වෙබ්අඩවි ගිණුමකින් ඔබගේ තොරතුරු දන්නා හෝ නොදන්නා ඕනෑම අයෙකු සමග සම්බන්ධ කළ හැකිය. මේ තොරතුරු අතර හොඳ, නරක, සභ්‍ය හෝ අසභ්‍ය ඒවා තිබිය හැකිය. එම අයහපත් දේ නිසා ඔබට දැඩි අපහසුතාවලට මුහුණ පෑමට සිදුවේ.



## 6. නාඳුනන පුද්ගලයින්

සමාජජාල වෙබ් අඩවිවලින් හමුවන පුද්ගලයන්ගෙන් ප්‍රවේසම් වන්න. එසේ හමුවන්නන් දිගුකලක් ඇසුරු කළද ඔවුන්ට යටි අරමුණක් තිබිය හැක. මෙවැනි අය හඳුනා ගැනීම ඉතාමත් අපහසු බැවින් ආගන්තුකයන්ට ඔබේ පෞද්ගලික තොරතුරු ලබා නොදෙන්න. එවැනි තොරතුරු ලබාදීමෙන් ඔබ වෙනත් අයකුගේ පහත් අරමුණු සඳහා මුදලට විකිණෙනවා ඇත.